


**Revision ඇගයීම් අංක - 05**

විනාඩි 30 යි
30 Minutes

01. සාර්ව ආර්ථික විද්‍යාවේ දී අධ්‍යයනය කෙරෙන ඒකක සඳහා නිදසුනක් **නො වන්නේ,**

(1) සමස්ත නිමැවුම් මට්ටම.
(2) ව්‍යාපාර ආයතනයක වෙළෙඳ පොළ ක්‍රියාකාරිත්වය.
(3) ආර්ථික උත්පාත හා අවපාත.
(4) විරැකියා මට්ටම.
(5) ආර්ථික පසුබැසීම.

02. පහත ප්‍රකාශ අතුරින් අභිමතානුරූපී ප්‍රකාශයක් **නො වන්නේ** මින් කුමක් ද ?

(1) සුබ සාධන සේවා අඛණ්ඩ ව පවත්වා ගෙන යාම සඳහා මසකට ලක්ෂයකට වඩා වැඩි ආදායම් ලබන සියලු දෙනාගෙන් ම 2% ක බද්දක් අය කළ යුතු වේ.
(2) බදු සහන ලබාදීම්, බදු අහෝසි කිරීම් හා බදු අඩු කිරීම් නිසා රජයේ බදු ආදායම විශාල වශයෙන් අඩු වී ඇත.
(3) පාසල් යළි ආරම්භ කිරීමට පෙර සියලු ම පාසල් සිසුන්ට කොවිඩ් මර්දන එන්නත් ලබා දිය යුතුය.
(4) ඔක්තෝම්බර් මාසයේ දී සංචාරකයන් සඳහා රට යළි විවෘත කිරීමට ගෙන ඇති තීරණය අඥාන තීරණය කි.
(5) රට තුළ දැනට පවත්නා නිරෝධායන ඇඳිරි නීතිය තවදුරටත් දීර්ඝ කළ යුතු වේ.

03. ආර්ථික විද්‍යා අර්ථ කථනය අනුව "නොමිල භාණ්ඩයක්" යන්න වඩාත් හොඳින් විස්තර කළ හැක්කේ,

(1) පාරිභෝගිකයාට ශුන්‍ය මිලකට සැපයෙන භාණ්ඩයක් වශයෙනි.
(2) රජය විසින් නොමිලේ ලබාදෙන භාණ්ඩයක් වශයෙනි.
(3) භාණ්ඩය නිෂ්පාදනය කිරීම සඳහා හිඟ සම්පත් භාවිතා නො කරන භාණ්ඩයක් වශයෙනි.
(4) ස්වභාවධර්මයෙන් ලබා ගන්නා ඕනෑම භාණ්ඩයක් වශයෙනි.
(5) ස්ථාවර ආවස්ථික පිරිවැයක් යටතේ නිපදවිය හැකි භාණ්ඩයක් වශයෙනි.

04. ආර්ථික විද්‍යාව හදාරන ශිෂ්‍යයෙකු වශයෙන් ඔබට එකඟ විය හැකි ප්‍රකාශය හඳුනාගන්න.

(1) නියං කාලයේ දී වර්ෂාව නොමැති බැවින් වර්ෂා ජලය හිඟ භාණ්ඩයක් බවට පත් වේ. එබැවින් එය ආර්ථික භාණ්ඩයක් වේ.
(2) ශිෂ්‍යයින්ට නොමිලේ ලැබෙන බැවින් පාසල් පොත් ආර්ථික භාණ්ඩයක් නො වේ.
(3) සම්පත් ඌන උපයෝජනය, හිඟකම නැමති ගැටලුව ඇතිවීමට බලපාන ප්‍රධානතම හේතුව වේ.
(4) ආර්ථික භාණ්ඩ නිපදවීම සඳහා ආර්ථික සම්පත් මෙන් ම ආර්ථික නොවන සම්පත් ද යොදා ගත හැක.
(5) නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා යොදාගනු ලබන ස්වභාවධර්මයේ සියලු ම දායාදයන් ආර්ථික නොවන සම්පත් වේ.

05. ගැම්බල් මහතා රුපියල් 10 ක් දී ලොතරැයියක් මිල දී ගත් අතර, එමගින් ඔහුට පැරීසියට නොමිලේ ගුවන් සවාරියක් යාමේ අවස්ථාවක් හිමිවන ලදී. පැරීසියට ගුවන් සවාරියක් සඳහා සාමාන්‍යයෙන් රුපියල් ලක්ෂ 10 ක මුදලක් අවශ්‍ය වේ. මෙහි දී අදාල සංවිධායකයින් විසින් ගුවන් සවාරිය වෙනුවට රුපියල් ලක්ෂ 07 ක මුදලක් ලබා ගැනීමේ විකල්ප යෝජනාවක් ද ගැම්බල් මහතාට ඉදිරිපත් කර ඇත. ගැම්බල් මහතා ගුවන් සවාරිය තෝරා ගතහොත් ඔහුගේ ආවස්ථික පිරිවැය වන්නේ,

(1) රුපියල් 10
(2) රුපියල් 300,000
(3) රුපියල් 699,990
(4) රුපියල් 700,000
(5) රුපියල් 1,000,000

06. පහත දැක්වෙන දෑ අතුරින් ආර්ථික සම්පතක් ලෙස සැලකිය **නො හැක්කේ** කවරක් ද?

(1) ගෘහ නිර්මාණ ශිල්පීන්.
(2) මිනිරන් ආකරයක්.
(3) මිනිරන් පතලක්.
(4) ගොවිතැනට යොදාගන්නා වර්ෂා ජලය.
(5) අධිවේගී මාර්ග පද්ධතියක්.

07. නිෂ්පාදන සම්පත් හා භාණ්ඩ අතර මූලික වෙනස පිළිබිඹු කෙරෙන ප්‍රකාශය කුමක් ද ?

(1) නිෂ්පාදන සම්පත්වලට සාපේක්ෂව භාණ්ඩ හිඟකමකින් යුක්ත වේ.
(2) නිෂ්පාදන සම්පත්වල උපයෝගීතාවයක් පවතින අතර භාණ්ඩ ඵලදායීතාවයකින් යුක්ත වේ.
(3) නිෂ්පාදන සම්පත් ඵලදායීතාවකින් යුක්ත වන අතර භාණ්ඩ උපයෝගීතාවකින් යුක්ත වේ.
(4) නිෂ්පාදන සම්පත් ස්වභාවධර්මයේ දායාද වන අතර භාණ්ඩ මිනිසා විසින් නිපදවන ලද ඒවා වේ.
(5) නිෂ්පාදන සම්පත් හා භාණ්ඩ යන දෙක ම ඵලදායිතාවයකින් යුක්ත වේ.

08. පහත ප්‍රකාශ අතුරින් **සදොස්** වන්නේ,

(1) ආර්ථික නොවන භාණ්ඩ වුව ද ආර්ථික භාණ්ඩ බවට පත් විය හැක.
(2) යථානුරූපී මූලයන් සමඟ සම්බන්ධ කොට වුව ද අභිමතානුරූපි ප්‍රකාශ පැවතිය හැක.
(3) ප්‍රාග්ධනය තොග සංකල්පයක් වුව ද ප්‍රාග්ධනය භාවිතයෙන් නිපදවෙන දළ දේශීය නිෂ්පාදිතය ප්‍රවාහ සංකල්පය කි.
(4) හිඟ සම්පත්වල විකල්ප භාවිත පවතී නම් අවශ්‍යයෙන් ම තේරීමක් කළ යුතු ය.
(5) මිනිසා විසින් නිර්මාණය කොට ඇති සියලු ම දෑ ප්‍රාග්ධනය යන්නට අයත් වේ.

09. ලෝක බැංකුවේ නිර්ණායකයන්ට අනුව ශ්‍රී ලංකාව,

(1) අඩු ආදායම් ලබන රටකි.
(2) පහල මැදි ආදායම් ලබන රටකි.
(3) ඉහල මැදි ආදායම් ලබන රටකි.
(4) ඉහල ආදායම් ලබන රටකි.
(5) නැගී එන ආර්ථිකයක් සහිත රටකි.

10. පසුගිය දශක දෙක තුළ ශ්‍රී ලංකාවේ අඩු ම ආර්ථික වර්ධනයක් සහ ඉහළ ම ආර්ථික වර්ධනයක් පෙන්නුම් කළ වර්ෂ දෙක අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) 2001 හා 2011
(2) 2019 හා 2011
(3) 2020 හා 2012
(4) 2001 හා 2020
(5) 2015 හා 2019